# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 902/18 – 1995 දෙසැම්බර් 21 වැනි බ්‍රහස්පතින්ද – 1995.12.21
902/18 ஆம் இலக்கம் — 1995 ஆம் ஆண்டு திசெம்பர் மாதம் 21 ஆம் திகதி வியாழக்கிழமை
NO. 902/18 – THURSDAY, DECEMBER 21, 1995

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) (Published by Authority)


## I වැනි කොටස : (I) වැනි ඡේදය – සාමාන්‍ය

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු 35 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1995 දෙසැම්බර් මස 21 වන දින,
කොළඹ දී ය.

### නියමාවලිය

1. මේ නියමාවලිය 1995 අංක 4 දරන නියෝජ්‍ය උපකුලපතිවරයාගේ නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් එය ක්‍රියාත්මක විය යුතු ය.

2. පනතේ 35 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින්, විශ්වවිද්‍යාලයේ ස්ථිර ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, සහාය මහාචාර්යවරුන් සහ I වන ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අතුරෙන් කොමිෂන් සභාවේ සලකා බැලීම සඳහා, විශ්වවිද්‍යාලය විසින් ඉදිරිපත් කරනු ලබන නම් දෙකක් අතුරින් විශ්වවිද්‍යාලයක නියෝජ්‍ය උපකුලපතිවරයකු පත් කරනු ලැබිය යුතු ය.

3. කිසියම් තැනැත්තකු, අනුක්‍රමික ධුර කාල දෙකකට වැඩි ගණනකට විශ්වවිද්‍යාලයක නියෝජ්‍ය උපකුලපතිවරයා වශයෙන් පත්කරනු නොලැබිය යුතු ය.

4. නියෝජ්‍ය උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණකාල නිලධරයකු විය යුතු අතර ඔහු කලින් ධුරය හිස්කළහොත් හෝ 5 වන ඡේදය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, ඔහු පත්කරනු ලැබූ දින සිට ගණන් ගනු ලබන වර්ෂ තුනක කාලයක් හෝ හැටපස්වන විය සම්පූර්ණ කිරීම හෝ යන මෙයින් කලින් එළඹෙන අවස්ථාව තෙක් ඔහු ධුරය දරන්නේ ය.

5. පාලක සභාව විසින්, කොමිෂන් සභාව විමසා, සාධාරණ හේතුවක් මත නියෝජ්‍ය උපකුලපතිවරයා ධුරයෙන් ඉවත්කරනු ලැබිය හැකි ය.

6. විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා අමතන ලද ලිපියක් මගින් නියෝජ්‍ය උපකුලපතිවරයාට සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

7. නියෝජ්‍ය උපකුලපතිවරයා, ධුර දරීම නතරවන හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන අවස්ථාවක ඔහු හැට පස් වන විය සම්පූර්ණකර ඇත්නම් මිස, නියෝජ්‍ය උපකුලපතිවරයා වශයෙන් ඔහු පත් කරනු ලැබීමට කලින් ඔහු දැරූ තනතුරට පෙරළා පත් විය යුතුය.

8. රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙන යම් හේතුවක් නිසා තම ධුරයේ කාර්ය ඉටුකිරීමට නියෝජ්‍ය උපකුලපතිවරයාට තාවකාලිකව නොහැකි වන්නේ නම් ඒ නොහැකියාව ඇති වූ විට නියෝජ්‍ය උපකුලපති ධුරයේ කාර්ය කිරීම සඳහා සුදුසු බවට පාලක සභාව අදහස් කරන වැඩ පිළිවෙලක් පාලක සභාව විසින් යෙදිය යුතු ය. එසේ වැඩ පිළිවෙලක් යොදන තෙක් උපකුලපතිවරයා හෝ ඔහුගේ නාමිකයා ඒ ධුරයේ එදිනෙද කාර්ය කරගෙන යා යුතු ය.

9. නියෝජ්‍ය උපකුලපති ධුරයේ පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක ඒ පුරප්පාඩුව ඇතිවී දින හතක් ඇතුළත, 3 වන ඡේදය යටතේ ස්ථිර පත්වීමක් කරනු ලබන තුරු නියෝජ්‍ය උපකුලපති ධුරයේ කටයුතු කරගෙන යාමට සුදුසුයයි පාලක සභාව අදහස් කරන වැඩ පිළිවෙලක් යෙදිය යුතු ය. එසේ වැඩ පිළිවෙලක් යොදන තෙක් උපකුලපතිවරයා හෝ ඔහුගේ නාමිකයා විසින් ඒ ධුරයේ කාර්ය කරගෙන යා යුතු ය.

10. පනතේ විධිවිධානවලට යටත්ව, නියෝජ්‍ය උපකුලපතිවරයාගේ බලතල කාර්ය හා කර්තව්‍ය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ කටයුතුවලට අදාළ විය යුතු ය.

11. 1984 ඔක්තෝබර් මස 25 වන දින අංක 320/6 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1984 අංක 1 දරන නියෝජ්‍ය උපකුලපතිවරයකු පත් කිරීම පිළිබඳව වූ කාර්ය පරිපාටිය සඳහා වූ නියමාවලිය මෙයින් ඉවත් කරනු ලැබේ.

12. මේ නියමාවලියේ–

"පනත" යන්නෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අදහස් වේ ;

"කොමිෂන් සභාව" යන්නෙන් ඉහත පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ ; සහ

"විශ්වවිද්‍යාලය" යන්නෙන් ඉහත පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් අදහස් වේ.